පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විෂය:- පෙරදිග සංගීතය

සතිය- 2

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Department of Education,Sabaragamuwa Province/ Weekly School

## බීතෝවන් සහ මෝසාට් යන සංගීතඥයින් පිළිබඳ තොරතුරු, නිර්මිත සංධ්වනි

### ලුඩ්විග් වැන් බිතෝවන් මැතිතුමා



ලුඩ්විග් වැන් බිතෝවන් මැතිතුමා ජර්මනියේ බොන් නගරයේ උපත ලැබූ මෙතුමා ප්‍රංශ රජමැදුරේ රාජකීය සංගීතඥයා ලෙස කලක් කටයුතු කළේය .ළමා වියේදී තම පියාගෙන් සංගීතය ඉගෙන ගත් මෙතුමා පසුව මෝසාට් සහ හෙයිඩන් යන සංගීතඥයන් ගෙන් ශිල්ප හදාරා ඇත. මෙතුමාගේ සංගීතයේ තිබූ සුවිශේෂීතාවය වන්නේ පෙර නොවූ විරු සංගීත භාණ්ඩ යොදා ගැනීම හා සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක් යොදා ගැනීමයි. 1782 දී වයස අවුරුදු දොළහේ දී රාජකීය වාදක මණ්ඩලය මෙහෙය වන්නා වූ අතර 1784දී ප්‍රංශ රජමැදුරේ පියානෝ වාදකයා ද මොහු විය. එමෙන්ම රොමැන්ටික්වාදය ලොවට හඳුන්වා දීම නිසාවෙන් රොමැන්ටික්වාදයේ පියා යන විරුදාවලියෙන් මෙතුමා හැඳින්විය. ඔහු වඩාත් ප්‍රිය කළ නිර්මාණ ලෙස සඳහන්වන්නේ පියානෝ සොනාටාය.පියානෝ සොනාටා 32ක් නිර්මාණය කරන ලදී. ඉන් මූන් ලයිට් සොනාටා, ඇපාෂියානාටා,පැන්තටික්,ක්‍රොයිට්සර් යන ඒවා ලෝකප්‍රකට සොනාටා ලෙස හැඳින්විය හැක. මෙතුමා විසින් සිම්පනි නවයක් නිර්මාණය කරන අතර

එරෝයිකා

කොරල්

පැස්ටොරොල්

$E^b$ major number _3 යන ඒවා නිදසුන් ලෙස හැඳින්විය හැක'

පසු කාලෙක මෙතුමා ගේ දෙසවන් බිහිරි විය. බිහිරිවීමෙන් පසුව කරන ලද කෝරල් සංධ්වනිය කටහඬද යොදා ගත් නිර්මාණයකි .යුරෝපා සංගීත ඉතිහාසය තුළ අවසාන සම්භාව්‍ය සංගීතඥයා ලෙස මෙතුමා හැඳින්විය හැක.

උපත - 1770.12.16 විපත -1827.3.26

## වුල්ෆ් ගැන්ග් අමේදියස් මොසාර්ට්



ක්‍රිස්තු වර්ෂ 1956 ජනවාරි 27 වෙනි දින බටහිර ඔස්ට්‍රියාවේ සැල්ස්බර්ග් නුවර උපත ලැබීය .වයස අවුරුදු හයේදී තරම් කුඩා කාලයේ දී ස්වර ප්‍රස්තාර කියැවීමේ සුවිශේෂ කුසලතාවය ප්‍රදර්ශනය කළ අමේදියස් මොසාට් දක්ෂ වයලීන වාදකයකු මෙන්ම හාර්පිසිකෝඩ් වාදකයකු ලෙස ප්‍රසිද්ධ විය .තම පියාගෙන් සංගීතය උගත් මෙතුමා වයස අවුරුදු හයේ දී ප්‍රසිද්ධ සංගීත ප්‍රසංග පැවැත්විය .වයස අවුරුදු අටේදී ප්‍රථම සංගීත සංධ්වනිය නිර්මාණය කර ඇත.අවුරුදු 11දී ප්‍රථම ඔරටෙොර්රියද වයස 12දී ප්‍රථම සංගීත ඔපෙරාව ද නිර්මාණය කර ඇත. වයස 14 ප්‍රථම සංගීත ස්ට්‍රිංට්‍රියෝව නිර්මාණය කර ඇත. 1769 සැල්ස්බර්ග් වල බිෂොප්වරයකු යටතේ සංගීත කණ්ඩායම මෙහෙය වන්නා ලෙසද කටයුතු කර ඇත. ලෝකප්‍රසිද්ධ බිතෝවන් සංගීතඥයා ගේ ගුරුවරයා වූයේ මෙතුමාය .මෙතුමා විසින් නිර්මාණය කළ ද සිම්පනී කිහිපයක් වන්නේ

1. SYMPHONY NO.36 IN C MAJOR
2. SYMPHONY NO.38 IN D MAJOR-PRAGUE
3. SYMPHONY NO.39 IN $E^b$ MAJOR
4. SYMPHONY NO.40 IN MINOR
5. SYMPHONY NO.41 IN C MAJOR-JUPITER

මොසාට් විසින් නිර්මාණය කරන ලද ඔපෙරා කීපයක් පහත දැක්වේ

1 MITHRIDATES,KING OF PONTUS

2 IDOMENCO,KING OF CRETE

3 THE ABDUCTION FROM THE SERAGLIO

4 THE MARRIAGE OF FIGARO

5 DON GIOLVANNI

6 COSIFAN TUTTE

7 THE MAGIC FLUTE

තවද SONATAS,CONCERTOES ආදීනිර්මාණ රාශියක් බිහිකළ මොහු 1791.12.05 දින දැයෙන්  සමුගත්හ.

***පැවරුම***

මොසාට්, බිතෝවන් යන අපරදිග සංගීතඥයන් දෙදෙනාගේ එක් අයෙකු පිලිබඳ ජීවන තොරතුරු දෙකක් සහ සංගීතමය තොරතුරු තුනක් ලියන්න